# පුරාවිද්‍යා ස්මාරක කෙරෙහි අභිචාරමය කටයුතුවලින් සිදුවන බලපෑම

**පී.වී.ඕ. ජීවන්තක[1], කේ.ආර්.සී.එස්. කල්දේරා[2]**

පුරාකෘති යනු යම් සංස්කෘතියක් හෝ කිහිපයක ආභාසය ලබා නිර්මාණය වී පුරාවිද්‍යාත්මක සන්දර්භයකට එක්වන්නකි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්මාරක කිහිපයක් වෙත ආරෝපණය වී ඇති නූතන සමාජ විශ්වාසය හා එම සංකල්පයන් වර්තමානය වන විට පුරාවිද්‍යා ස්මාරකවල පැවැත්මට බලපා ඇති ආකාරය පෙන්වා දීමය. ඒ අනුව උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන කිහිපයක් වන මිහින්තලේ කටුසෑය, අනුරාධපුර අභයගිරි විහාරයේ බටහිර පස ඇති මුරගල් දෙක හා දකුණු දොරටුව ආසන්නයේ ඇති සංඛ පද්ම මුරගල් දෙක මෙම අධ්‍යයනය සඳහා තෝරාගන්නා ලදි. අදාළ ක්ෂේත්‍ර ආශ්‍රිතව ජීවත් වන ප්‍රදේශවාසීන් සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා මඟින් හා ක්ෂේත්‍ර නිරීක්ෂණය තුළින් මේ සඳහා තොරතුරු එක්රැස් කරගන්නා ලදි. ඉහත පුරාවිද්‍යා ස්ථානවල වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේ දී මෙම ස්ථාන ආශ්‍රිත සමාජ විශ්වාසයන් ගොඩනැගී ඇත්තේ දිගුකලක සිටය. මේවා ගැමි විශ්වාස ලෙසින් විකාශනයකට වී සමාජය තුළ පිළිගත් මත බවට පත් වී ඇත. මෙම විශ්වාසයන්හි සත්‍ය අසත්‍යතාව කෙසේ වෙතත් මෙහි ප්‍රතිඵල මත ඉහත පුරාවිද්‍යා ස්ථානවල ඇති වී ඇති සංවර්ධන කටයුතු වැනි ධනාත්මක බලපෑම් සහ විනාශ වීම සහ නොසැළකිල්ලට ලක්වීම වැනි ඍණාත්මක බලපෑම් අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. විවිධ විශ්වාසයන් මුල්කර ගනිමින් ඉහත පුරාවිද්‍යා ස්ථාන තුළ සිදු කරන අභිචාර කටයුතු නිසා එම පුරාවිද්‍යා ස්මාරක ආශ්‍රිතව සිදු කරන විවිධ පූජාවන් හේතුවෙන් ස්මාරකවලට විශාල හානියක් සිදු වී ඇති බව අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. අභයගිරි ස්තූපයේ බටහිර පස ඇති මුරගල් දෙකෙහි හුණුගල්වා විනාශ කර තිබීම පෙන්වාදිය හැකි අතරම දකුණු පස ඇති මුරගල විවිධ පූජාවලට ලක්කර තිබේ. කටුසෑය ආශ්‍රිතව දෛනිකව පවත්වන පූජාවලින් ස්මාරකයේ බොහෝ කොටස්වලට හානි සිදු වී තිබේ. මෙම ස්ථාන ආශ්‍රිතව ගොඩනැගී ඇති මත එකිනෙකාගේ සිතුම් පැතුම් සහ අවශ්‍යතාවය අනුව වෙනස් වන බව එම ස්ථාන ආශ්‍රිතව සිදුවන අභිචාර කටයුතු විමර්ශනය කිරීමේ දී පැහැදිලි විය. එසේම මිනිසුන් අදාළ ස්මාරකවලට ගරු කිරීම නිසා එක් අතකින් ඒවායේ පැවැත්ම ද තහවුරු වී තිබේ. ඉහත කරුණු ඔස්සේ එළඹිය හැකි නිගමනය වන්නේ සමාජය තුළ ඇති බොහෝ මනඃකල්පිත විශ්වාස ස්මාරක ආශ්‍රිතව දිගුකලක සිට පැවත එන අතර එම විශ්වාස පුරාවිද්‍යා ස්මාරකවල පැවැත්මට අහිතකර මෙන්ම හිතකර ලෙස බලපෑම් කරන බව ඒ ආශ්‍රිතව සිදුවන අභිචාර අනුව හඳුනාගත හැකිය.

ප්‍රමුඛ පද : සමාජ විශ්වාස, ස්මාරක, හායනකාරක, අභිචාර

---

[1 2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය jeewanthaka1234@gmail.com